**මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2023**

**------------------------------------------------------------**

මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන කොළඹ මහා නගර සභාව සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 එස්ආර්අයි සහ අංක 2558 එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුම්වල 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම්වලට අනුව එවකට පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කොළඹ මහා නගර සභාව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාගර හා මිරිදිය ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ මිලියන 1.5 ක නාගරික හා උප නාගරික වැසියන්ගේ නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. (අ) මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) වත්කම් කළමණාකරණය, මූල්‍ය කළමණාකරණය, මෙහෙයුම් කාර්යසාධනය නියාමනය, පාරසරික නියාමන අනුකූලතාවය, පාරිභෝගික සේවා සහ නිසි සනීපාරක්ෂක සේවා සැපයීමේදී ආයතනික සහ මෙහෙයුම් ධාරිතාවය ශක්තිමත් කිරීම (ඇ) ව්‍යාපෘති කළමනාකරණය සහ ආයතනික සහාය යනාදි සංරචක යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,597.11කට සමාන එජඩො මිලියන 110.24ක් වන අතර ඉන් රු.මිලියන 10,783.65 කට සමාන එජඩො මිලියන 94.37ක් ආසියානු සංවර්ධන බැංකුව මඟින් මූල්‍යයනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,813.46කට සමාන එජඩො මිලියන 15.87ක් ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 අප්‍රේල් 09 දින ආරම්භ කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දින 2023 ජූනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | මෙම පනත යටතේ බදු ප්‍රතිපූර්ණය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට රු. මිලියන 14ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත | අධිකාරය නොලත් ගෙවීම් අයකර ගත යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී මාස තුනකට නොඅඩු කාලයකදී මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවෙතත්, මාස 3 කට පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2023 දෙසැම්බර් 31 දිනට<br>අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්ය සාධනය ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| **ප්‍රධාන මලාපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම**<br>අපජල පොම්පාගාරය සහ පොම්ප කිරීමේ ජාලය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.<br>**පොම්පාගාර** | | | ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 9 වන දින ආරම්භ කර 2015 ජුනි 30 දින නිම කිරීමට නියමිතව තිබුණද, නිමකිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා 6 වතාවක් දීර්ඝ කර තිබුණි. | (අ)ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතා හේතුවෙන් ශක්‍යතා අධ්‍යයනය, පාරිසරික තක්සේරුව, ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලින් ප්‍රමාද වීම සඳහා බලපාන ලදි.<br>(ආ) ප්‍රතිපත්ති සහයක කණ්ඩායමෙන් අපේක්ෂිත සහාය නොලැබීම.<br>(ඇ)කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය |
| මාලිගාවත්ත | 100 | 77 | | |
| බොරැල්ල | 100 | 73 | | |
| විට්ස්වයික් | 100 | 76 | | |
| තිඹිරිගස්යාය | 100 | 81 | | |

**කළමනාකරණයේ අදහස් දැක්වීම** නොවැළැක්විය හැකි හේතු සහ සම්මුතික බැඳීම් හේතුවෙන් කොන්ත්‍රාත්තුව දීර්ඝ කරන ලදි. කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය වේ.

**විගණකගේ නිර්දේශය** අවශ්‍ය ගුණාත්මක මට්ටම සහතික කරමින් වැඩ කඩිනමින් නිම කිරීමට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු පෙළඹවිය යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කොළඹ මහ නගර සභාවේ අපජල පොම්පාගාර සැලසුම්කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු | විගණනය විසින් නිරීක්ෂණය කරන ලද පරිදි අමතර කොටස් අයිතමවල කොටස පමණක් සපයා ඇති අතර කොන්ත්‍රාත් ලේඛනයේ එකඟ වූ | දැනට සපයා ඇති අමතර කොටස් තොග සහ තවදුරටත් |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත්තු අංක ජීසීඩබ්ලිව්එම්පී/ඒඩීබී/පීඑස්/01/අයිසීබී/වැඩ/03 /2013 යටතේ යුරෝ 887,104 ක්, එජඩො 937,976 ක් සහ රු මිලියන 52.4ක් වටිනා අත්‍යාවශ්‍ය අමතර කොටස් සැපයීමට එකඟ වී තිබුණි. කෙසේවෙතත්, 2023 දෙසැම්බර් 31 වන විට යුරෝ 739,906, එජඩො 777,736 සහ රු මිලියන 52.4ක් වටිනා අත්‍යාවශ්‍ය අමතර කොටස් සැපයිව යුතුව තිබුණි. | කොන්දේසිවල පවතින ගැටළු හේතුවෙන් ඉතිරි කොටස් සපයා නොමැත. එම ගැටළු විසඳීමට කටයුතු කරමින් පවතී. කෙසේවෙතත්, පොම්පාගාරය ක්‍රියාත්මක වන විට අමතර කොටස් අවශ්‍ය වන අතර එමනිසා අමතර කොටස් සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභවලට බලපෑමක් නොමැත. | සැපයීමට නියමිත අමතර කොටස් සැපයීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලය සහ කොළඹ මහ නගර සභාව කඩිනම් පියවර ගත යුතුය. |

**3.3 උපයෝජනය නොකළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විට්ස්වයික්, බොරැල්ල, තිඹිරිගසාය, මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් එම පොම්පාගාර 04 සඳහා 2016 වර්ෂයේ මිලදීගත් යන්ත්‍ර සහ උපකරණ 2023 දෙසැම්බර් 31 දක්වා එම පොම්පාගාරවල ස්ථාපනය කළ නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් පොම්පාගාර අටක් සඳහා යන්ත්‍ර සූත්‍ර එක් තොගයක් ලෙස මිලදී ගෙන සපයා ඇති බැවින්, පොම්පාගාර හතරක ස්ථාපනය නොකළ යන්ත්‍රෝපකරණ තොගයේ පවතී. කෙසේවෙතත්, ස්ථාපනය සඳහා කොන්ත්‍රාත්කරුගේ වගකීම් සහතිකය ලබා දී ඇති බැවින් යන්ත්‍රෝපකරණවල වගකීම් කාලය ඉකුත්වීමෙන් සේවා යෝජකයාට කිසිදු බලපෑමක් සිදු නොවේ. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

**3.4 මතභේදයට තුඩුදෙන ගැටළු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ණය ගිවිසුම් අංක 2557 එස්ආර්අයි සහ 2558 එස්ආර්අයි දරන මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, 2010 අප්‍රේල් 04 දින ආරම්භ කර 2015 ජුනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ අවසන් දිනය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතිය නිම කිරීම මාස 96කින් ප්‍රමාද වී ඇත. | නොවැළැක්විය හැකි තත්ත්වයන් සහ ගිවිසුම්ගත බැඳීම් හේතුවෙන් ව්‍යාපෘතියේ එක් කොන්ත්‍රාත්තුවක් දීර්ඝ කිරීමට සිදුවීම ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට ප්‍රධාන හේතුව විය. කෙසේවෙතත්, 2023.06.30 න් ඔබ්බට තවදුරටත් දීර්ඝ කිරීමක් ලබා නොදුන් බැවින්, දේශීය අරමුදල් යොදා ගනිමින් කොන්ත්‍රාත්තුවේ අසම්පූර්ණ වැඩ නිම කිරීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

**3.5 වැඩබිම් පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විට්ස්වයික්, බොරැල්ල, තිඹිරිගසාය සහ මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් තාවකාලික විසඳුමක් ලෙස බයිපාස් ක්‍රමයක් යටතේ අපජලය පොම්ප කිරීමට සිදුවන බවත්, ඒ අනුව ව්‍යාපෘතියට අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය. | පොම්පාගාර නිම කිරීමේ ප්‍රමාදය හේතුවෙන් බයිපාස් පොම්ප කිරීමේ ක්‍රමය අවශ්‍ය වූ බව සත්‍යයකි. නිතිපතා බිඳවැටීම් වළක්වා ගැනීම සඳහා නව පොම්ප ආදේශ කිරීමට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

**3.6 නොවිසඳී පවතින පෙර විගණන වාර්තාවලින් පෙන්වා දුන් කරුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ජලාපවහන අංශයට හඳුන්වා දෙනලද වටිනාකම රු. මිලියන 3.2ක් වන මූල්‍ය කළමණාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි. | නව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කොළඹ මහනගර සභාව විසින් පියවර ගෙන ඇත. | විදේශ ආයෝජන ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුයි. |

**3.7 පාරිසරික කරුණු සම්බන්ධ ගැටළු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| පොම්පාගාර තුනක ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු ඒවා කොළඹ මහනගර සභාවට භාර දුන් අතර 2021 නොවැම්බර් 24 වන දින කොම්පඤ්ඤවීදිය පොම්පාගාරයේ සිදු කරන ලද පූර්ව ආරම්භ කිරීම් පරීක්ෂණයේදී ප්‍රධාන යන්ත්‍රයට හානි වී ඇති බව නිරීක්ෂණය වී ඇති අතර පොම්පාගාරයේ යන්ත්‍රෝපකරණ අක්‍රියව පැවතුනි. තවද, විවෘත ඇළ මාර්ගයක් ඔස්සේ බේරේ වැවට අපජලය මුදා හැරීම නිසා පරිසර හානියක් සිදුවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | ගුණාත්මක ඉදිකිරීම් සිදුකිරීමෙන් පරිසර හානිය වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |